# දේශපාලන විසඳුම

අප බොහෝ අවස්ථාවල කියා ඇත්තේ හමුදා ක්‍රියාමාර්ග ද යම් දේශපාලන ප්‍රශ්නයකට ඇති දේශපාලන විසඳුමක් බව ය. දේශපාලනය යන්න කිනම් අර්ථයකින් ගත්ත ද බලය වටා කැරකැවෙයි.. එය පාර්ලිමේන්තුව හා රජය සමග පමණක් සම්බන්ධ නො වෙයි. වෙනත් ආයතනවල, දෙපාර්තමේන්තුවල, රෝහල්වල, නිවෙස්වල ආදියෙහි ද දේශපාලනය වෙයි. අවුරුදු පන්සියයක පමණ කාලයක් තිස්සේ මෙරට ප්‍රධාන දේශපාලන ප්‍රශ්නය වී ඇත්තේ සිංහල බෞද්ධ සංස්කෘතියට මෙරට හිමි තැන අහිමි කිරීම ය. එය සංස්කෘතික ප්‍රශ්නයක් හෝ ආර්ථික ප්‍රශ්නයක් හෝ නොව දේශපාලන ප්‍රශ්නයකි.

පෘතුගීසීන් මෙරටට පැමිණි දින සිට අපි මේ ප්‍රශ්නයට මුහුණ පා ඇත්තෙමු. පෘතුගීසීහු විවිධාකාරයෙන් සිංහල බෞද්ධ සංස්කෘතිය නැසීමට උත්සාහ ගත්හ. ලන්දේසීහු එයට වඩා සියුම්ව සිංහල බෞද්ධ සංස්කෘතිය නැසීමට උත්සාහ කළහ. ඔවුහු දෙමළ ජාතිවාදය ආරම්භ කළා පමණක් නොව මහනුවර සිංහල රාජ්‍යයට වත්මන් නැගෙනහිර පළාත අහිමි කිරීමට දෙමළ ජාතිවාදය යොදාගත්හ. ඔවුහු දෙමළ මුදලිවරයකු ලවා යාල්පානම් වෛපව මාලෙයි නමින් ඊනියා ඉතිහාස පොතක් ලියවා ඒ ඔස්සේ තමන් සිංහල රජුගෙන් බද්දට ලබාගෙන තිබූ නැගෙනහිර වෙරළේ බිම් තීරුව රජුට නොව දෙමළ ජනයාට අයත් බව පෙන්වීමේ අසාර්ථක උත්සාහයක නිරතවූහ.

පසු කලෙක බ්‍රිතාන්‍යයෝ ලන්දේසීන්ගේ උපක්‍රමය වඩාත් තීව්‍ර කළහ. ඔවුහු මෙරට නායකත්වයට දෙමළ වෙල්ලාලයන් පත්කිරීමට උත්සාහ කළහ. අප කලින් ද සඳහන්කර ඇති පරිදි වෙල්ලාල යන්නෙහි තේරුම කෘෂිකාර්මික කම්කරුවා යන්න ය. මොවුහු ලන්දේසීන් විසින් ලංකාවට ද දකුණු අප්‍රිකාවට ද ගෙනයනු ලැබූහ. අද උතුරු පළාතේ සිටින ජනයා දුම්කොළ වැවීම සඳහා ලන්දේසීන් විසින් ගෙන්වනු ලැබූ මේ පිරිසෙන් ද එවකට එහි පදිංචි ව සිටි සිංහල ජනයාගෙන් ද මලයාලම් බස කතාකළ කේරළයෙන් පැමිණි වේලක්කාර හමුදා භටයන්ගෙන් ද පැවත එන්නෝ වෙති. ඔවුහු යථා කාලයේ දී සියල්ලෝම දෙමළ වූහ. උතුරේ කෝවියාර් නලවාර් ආදී කුලවල සම්භවය ඒ සිංහල පවුල් වෙත දිව යයි. යාපනයේ දෙමළ බසෙහි තමිල්නාඩු දෙමළ බසට වඩා මලයාලම් වචන ඇත්තේ වේලක්කාර සම්බන්ධය හේතුකොටගෙන ය. කෙසේ වෙතත් උතුරේ දෙමළ බසේ ඉතිහාසය අවුරුදු තුන්සිය පනහකට වඩා ඈතට නො යයි.

බ්‍රිතාන්‍යයන්ට හා ඉන් පෙර ලන්දේසීන්ට අවශ්‍ය වූයේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය අකා මකා බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය අප මත පැටවීමට ය. එහි දී ඔවුහු දෙමළ ජාතිවාදය ඒ සඳහා යොදාගත්හ. යාල්පාන වෛපව මාලෙයි ලියූ දවසේ සිට ප්‍රභාකරන් දක්වා මෙරට ඉතිහාසය යනු අන් කිසිවක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් සිංහල බෞද්ධ සංස්කෘතියට මෙරට හිමි තැන අහිමි කිරීම සඳහා දෙමළ ජාතිවාදය යොදා ගැනීමේ කතාව ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් දෙමළ ජාතිවාදය බිහිකෙරුණා පමණක් නොව පෝෂණය කර ආරක්ෂා කරනු ලැබිණි. සිංහල බෞද්ධයන්ගේ ඊනියා ම්ලේච්ඡත්වය පිළිබඳ ප්‍රභාකරන්ගේ ඊනියා දක්ෂතාව පිළිබඳ ව ලෝකය පුරා ප්‍රචාරය කරනු ලැබුවේ බටහිර ක්‍රිස්තියානීන් විසිනි. ඊනියා සාම සාකච්ඡා ඔස්සේ ප්‍රභාකරන් ආරක්ෂා කිරීමේ වෑයමෙහි නිරත වූවෝ වටහිර ක්‍රිස්තියානි ජාතීහු ය. මෙරට සාම වෙළෙන්දන්ගෙන් ද බහුතරය සමන්විත වූයේ කසිකබල් මාක්ස්වාදීන්ගෙන්, කසිම කසිකබල් පශ්චාත් මාක්ස්වාදීන්ගෙන් හා විවිධ ක්‍රිස්තියානි සභාවල නියෝජිතයන්ගෙනි.

බටහිරයන් විසින් සිංහලයන්ට එරෙහිව ඇති දැඩි කර පෝෂණය කරනු ලැබූ දෙමළ ජාතිවාදයේ විකාශයෙහි එක් අවස්ථාවක දී එනම් 1976 දී චෙල්වනායගම් යන ඊනියා අහිංසාවාදියා වඩුක්කොඩෙයි සම්මේලනයේ දී දෙමළ එක්සත් පෙරමුණ පිහිටුවා සිංහලයන්ට මුළු රටම බැරි නම් අඩු තරමින් බ්‍රිතාන්‍යයන් විසින් ඇතිකරනු ලැබූ උතුරු හා නැගෙනහිර පළාත් අහිමි කිරීම සඳහා රට බෙදන යෝජනාව සම්මතකර ගත්තේ ය. ඒ මෙරට දෙමළ ජාතිවාදයේ උච්චතම අවස්ථාව විය. ආපසු හැරී බලන විට පෙනී යන කරුණ නම් එදා සිට දෙමළ ජාතිවාදය ක්‍රමයෙන් අවරෝහණය වී ඇති බව ය.

චෙල්වනායගම්ගේ බෙදුම්වාදී ක්‍රියා මාර්ගය ඉදිරියට ගෙන යෑම සඳහා ප්‍රභාකරන්, උමා මහේස්වරන් ආදීහු අවි අතට ගත්හ. දෙමළ ජාතිවාදය හිංසාව, ප්‍රචණ්ඩත්වය දෙසට තල්ලු කෙළේ අන් කිසිවකු නොව ඊනියා අහිංසාවාදියා වූ

© Prof. Nalin De Silva

වෙල්වනායගම් ය. ඉන්දියාවේ ගාන්ධි ද ඊනියා අහිංසාවක් ගැන දෙසමින් ජනතාව හිංසාව වෙතට තල්ලු කෙළේ ය. ගාන්ධි මියගියේ ඒ ප්‍රචණ්ඩත්වයේ ම ප්‍රතිඵලයක් ලෙස ය. ලංකාවේ ඊනියා අහිංසාවාදියා ප්‍රචණ්ඩත්වයෙන් මිය නොගියේ ඔහු එයට පෙර වයස්ගත වී ස්වාභාවික මරණයකට ගොදුරු වූ බැවිනි. ඔහු තවත් තරමක් කල් ජීවත්ව සිටියේ නම් ප්‍රභාකරන්ගේ වෙඩි පහරකින් මිය යෑමට තිබුණි. ඔහුට එසේ මියයෑමට අවස්ථාව නොලැබුණු නමුත් අමිර්තලිංගම් ආදී ඔහුගේ අනුගාමිකයන් රාශියකට ම ඒ අවස්ථාව උදාවිය.

දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය යනු බටහිරයන් විසින් ඇතිකරනු ලැබ පෝෂණය කෙරෙන දෙමළ ජාතිවාදයේ එක් අංගයක් පමණකි. බටහිරයන් ත්‍රස්තවාදයට ද උදව් දී ඇති අයුරු දැන් දැන් හෙළිවෙමින් පවතියි. බටහිරයන්ගේ මුදලින් පිහිටවනු ලැබූ විවිධ රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ කොටි පෝෂණය කෙරුණු අන්දම තව දුරටත් පසුව හෙළිවනු ඇත. උතුරට ගිය ඊනියා සාමකාමී ක්‍රිස්තියානි සංවිධාන ගැන තවත් සොයා බැලිය යුතු ය. දෙමළ ජාතිවාදය පරාජය කරනු වෙනුවට, එහි අංගයක් වූ ත්‍රස්තවාදය හමුදා ක්‍රියාමාර්ගවලින් පරාජය කරනු වෙනුවට, බටහිරයෝ ප්‍රභාකරන් ආරක්ෂා කරන ඊනියා සාම වැඩ පිළිවෙල් ඇරඹූහ. ඔවුහු ඒ අතර කොටි සංවිධානය තව තවත් පෝෂණය කළහ. අධ්‍යාපනයෙන් නිවටයන් කරනු ලැබූ නායකයන් සිංහලයන්ට ලබා දුන් බ්‍රිතානියෝ මේ නායක නායිකාවන් ලවා ඊනියා දේශපාලන විසඳුමක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළහ. බටහිරයන්ගේ මෙරට සිටින රාජ්‍ය නොවන සහ වෙනත් ඇම්බැට්ටයෝ සුදු නෙළුම් අතින් ගෙන අවලම් තවලම් යමින්, ඊනියා ගැටුම් නිරාකරණ කඳවුරු පවත්වමින් හමුදාවට සිල් ගැනීමට උපදෙස් දෙමින් බෙදුම්වාදී ත්‍රස්තවාදය පෝෂණය කළහ. මොවුන්ගේ දේශපාලන විසඳුම යනු අන් කිසිවක් නොව ප්‍රශ්නය ම ඉදිරියට ගෙන යෑමක් විය. ප්‍රශ්නය වූයේ මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන ලබා නො දීම ය. දෙමළ ජාතිවාදයත් එහි අංගයක් වූ ත්‍රස්තවාදයත් ඇතිකරන ලද්දේ ඒ තව තවත් වර්ධනය කරමින් හැකිනම් සිංහල බෞද්ධ සංස්කෘතිය නැති කිරීමට ය. යම්කිසි අයුරකින් ඊළමක් පිහිටුවනු ලැබිණි නම් සිංහලයන්ට සිදුවීමට තිබුණේ සැමදාමත් බටහිරයන්ගේ ආධාර කබන ඊළම සමග යුද්ධ කිරීමට ය. පළාත් සභාවල අරමුණ වූයේ ක්‍රමයෙන් වැඩි බලතල ලබා දෙමින් සන්ධීය රාජ්‍යයක් කරා පා නැගීමට ය. සන්ධීය රාජ්‍යය ඊළම බවට පත්වීමට තිබුණි. ඊනියා දේශපාලන විසඳුම යනු ප්‍රශ්නය ම ඉදිරියට ගෙන යෑමක් වූයේ එබැවිනි.

බටහිරයන්ගේ දේශපාලන විසඳුම කෙසේ වුවත් ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් අවශ්‍ය වෙයි. ප්‍රශ්නය බටහිරයන් විසින් ඇතිකෙරී පෝෂණය කෙරුණු දෙමළ ජාතිවාදය ය. එයට ඇත්තේ එක් විසඳුමක් ම පමණකි. ඒ දෙමළ ජාතිවාදය පරාජය කිරීම ය. එහි අංගයක් වූ ත්‍රස්තවාදය පරාජය කළ නොහැකි යැයි බටහිරයන් කී නමුත් නිවට ජනාධිපතිවරුන් හා ජනාධිපතිවරියන් ඒ පිළිගත් නමුත් අප සැමදාමත් කියා සිටියේ ඒ පරාජය කිරීමට හැකි බවත් ඒ පරාජය කළ යුතු බවත් ය. මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන නායකත්වය යටතේ ආරක්ෂක ලේකම්ගේ හා හමුදාපතිවරුන්ගේ යුද නායකත්වය යටතේ වීරෝදාර සෙබළුන් විසින් අද ඒ කෙරෙමින් පවතියි. එය දේශපාලන විසඳුමේ එක් ප්‍රධාන කොටසක් වෙයි. එහෙත් සමස්ත ප්‍රශ්නයට විසඳුම ඒ පමණක් නො වෙයි. හමුදා ක්‍රියාමාර්ගවලින් ත්‍රස්තවාදය පරාජය කෙරුණ ද දෙමළ ජාතිවාදය පරාජය කෙරී නැත. හමුදා සෙබළු සාමාන්‍ය දෙමළ ජනයාගේ සිත් දිනාගැනීම සම්බන්ධයෙන් ද ජයග්‍රහණ ලබා ඇති බවත් එය ද දෙමළ ජාතිවාදය පරාජය කිරීමේ එක් පියවරක් බවත් මෙහි ලා සඳහන් කළ යුතු ය. අද අපට ඉතිරිව ඇත්තේ දෙමළ ජාතිවාදයේ හරය පරාජය කිරීම ය. දෙමළ නායකයන් මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි විය යුතු තැන ලබාදීමට විරුද්ධ නොවිය යුතු ය. ඔවුන් මෙරට සංස්කෘතියේ ප්‍රධාන සංරචකය සිංහල බෞද්ධ සංස්කෘතිය බව පිළිගත යුතු ය. ඔවුන් ලෝකයේ කොහේවත් නැති ඊනියා බහුසංස්කෘතික රටක් පිළිබඳ බහුබූතය  අත්හැරිය යුතු ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අනුග්‍රහය ලබන ඔවුන් ඒ එක රැයින් අත් නොහරිනු ඇත. ඒ ඔවුන් ලවා අත්හැරවිය හැක්කේ සිංහලයන්ට ය. පසුගිය අවුරුදු පහක පමණ කාලයක දී රනිල් වික්‍රමසිංහ රවි කරුණානායක වැනි ක්‍රිස්තියානි සංස්කෘතියේ සුළුතරයක් හැරුණුවිට අන් සිංහලයන්ට හමුදාවට කොටින් පරාජය කළ හැකි බවට එකමතියකට පැමිණීමට හැකි විය. එමෙන් ම සිංහල බෞද්ධ සංස්කෘතිය මෙරට සංස්කෘතියේ ප්‍රධාන සංරචකය බවට එකමතියකට පැමිණීමට රනිල් රවි වැන්නන් හැරුණු විට අනෙක් සිංහලයන්ට හැකිවිය යුතු ය. එදින දෙමළ ජාතිවාදය පැරදී දෙමළ නායකයන් බහුසංස්කෘතික බහුබූතය අත්හරිනු ඇත. එවිට දෙමළ නායකයකුට මෙරට ජනාධිපති වීමට වුව ද හැකිවනු ඇත. සිංහල බෞද්ධ සංස්කෘතිය මෙරට සංස්කෘතියේ ප්‍රධාන සංරචකය බවට පිළිගැනීම හැරෙන්නට ප්‍රශ්නයට වෙනත් දේශපාලන විසඳුමක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva